


Welcome To LAkruhunu Buddhist Site

ශ්‍රී. බු. ව. 2554 ඇසළ මස කලාපය, රා. ව. 2010 ක් වූ ජූලි මස 25 වන දින

මාතර, ශ්‍රී සුදර්ශි මහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති
ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන් වහන්සේ විසිනි.

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස**

**පද්මෝපමාව ජීවිතයට ආදර්ශ කරගනිමු**
**(උඩගුතතර නිකායේ ද්‍රෝණ ලෝක සූත්‍රය.)**

**ධර්මකාමී පින්වතුනි,**

**අද ඇසළ පුර පසළොස්වක පොහොය දිනය යි. සිදුහත් බෝසතාණන් වහන්සේ තුසිත දෙව් ලොවින් චුතව මහමායා දේවියගේ කුස පිළිසිඳ ගත්තේ අද වැනි පොහොය දිනයක ය. බුදුබව පතා ගිහිගෙයින් නික්මීම, බරණැස ඉසිපතන නම් වූ මිගදායේදී පළමු ධර්ම දේශනාව පැවැත්වීම, කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝවාන් වීම හා පැවිදි උපසම්පදාව ලැබීම, ඒ නිසාම ලෝකයට තුණුරුවන් පහළ වීම ආදී ශාසනික ඉතිහාසයේ වැදගත් කරුණු රාශියක් සිදුවූයේ ද අද වැනි පොහොය දිනයක ය. ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා අද දින පොහොය කර්ම කොට වස් විසීම සිදුකරන්නේ හෙට දිනයේ ය. මෙවැනි වැදගත් පොහොය**

දිනයක මෙම දහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ බුද්ධචරිතය ආදර්ශයට ගනිමින් අපේ ජීවිත සඵලවත් කර ගැනීමට යි.

මේ ලොකයේ පහළවූ ඉතාම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා ගෞතම බුදුරජාණන් වහන්සේ ය. ඒ උතුම් මනුෂ්‍යයා උපමාකොට ඇත්තේ පියුමකට ය. එම පද්මෝපමාව ජීවිතයට ආදර්ශ කරගෙන ගිහි පැවිදි අප හැම දෙනාගේම ජීවිත සඵලවත් කරගත යුතුයි. මෙම පද්මෝපමාව විස්තර කිරීම සඳහා අප මුලාශ්‍රය වශයෙන් භාවිතා කරන්නේ අඞගුත්තර නිකායේ චතුකක නිපාතයේ සඳහන්වන ද්‍රෝණ ලෝක සුත්‍රය යි.

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ උකකටඨා සහ සේතව්‍යා යන නගර දෙක අතර මාර්ගයට පිළිපන් සේක. ඒ මාර්ගයේම ගමන් කළ ද්‍රෝණ නම් බමුණා ඒ මාර්ගයෙහි සටහන්ව තිබූ පා සලකුණු දැක මෙසේ සිතී ය. ඒකාන්තයෙන්ම මේ මිනිසෙකුගේ පා සලකුණු නොවිය යුතුයි. මෙසේ සිතමින් ගමන් කරන බමුණාට දැකගන්නට ලැබුනේ ඒ පාර අසල ගසක් මුල පලක් බැඳගෙන වැඩහුන් බුදුරජාණන් වහන්සේ ය. ද්‍රෝණ බමුණා එතනට ගොස් තථාගතයන් වහන්සේගෙන් ප්‍රශ්න හතරක් ඇසී ය. එම ප්‍රශ්න හතර සහ ඊට ලැබුණු පිළිතුරු පහත දැක්වේ.

01. භාග්‍යවන්තයෙනි, ඔබ දෙවියෙක් ද? බ්‍රාහමණය මම දෙවියෙක් නොවෙමි.

02. භාග්‍යවන්තයෙනි, ඔබ ගාන්ධර්වයෙක් ද? බ්‍රාහමණය මම ගාන්ධර්වයෙක් නොවෙමි.

03. භාග්‍යවන්තයෙනි, ඔබ යක්‍ෂයෙක් ද? බ්‍රාහමණය මම යක්‍ෂයෙක් නොවෙමි.

04. භාග්‍යවන්තයෙනි, ඔබ මනුෂ්‍යයෙක් ද? බ්‍රාහමණය මම මනුෂ්‍යයෙක් නොවෙමි.

මේ පිළිතුරු හතරෙන් ද්‍රෝණ බමුණා විමතියට පත් වී එසේ නම් ඔබ වහන්සේ කවරෙක් දැයි ප්‍රශ්න කළ හ. එහිදී බුදුන්වහන්සේ බමුණාට දේශනා කළේ බ්‍රාහමණය කාමාදී ආශ්‍රව ප්‍රහීණ නොකිරීමෙන් දේව, ගාන්ධර්ව, යක්‍ෂ, මනුෂ්‍ය තත්වයට පත්වන බවත්, මම ඒ සියළු කාමාදී ආශ්‍රව ප්‍රහීණ කළ නිසා මිනිසුන් අතර උපන් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් බවත් ය.

මෙම සංවාදයේ දී බුදුන්වහන්සේ තමන්වහන්සේ හඳුන්වාදීම සඳහා යොදාගෙන තිබෙන්නේ පද්මෝපමාව යි

" සෙය්‍යථාපි බ්‍රාහමණ උපපලංවා පදුමංවා පුණඩරීකංවා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකං අච්චුගගමම ඨාති අනුපලිතතං උදකෙන එවමෙව බො අහං බ්‍රාහමණ ලොකෙ ජාතෝ ලොකෙ සංවඩ්ඪෝ ලොකං අභිභුය්‍ය විහරාමි අනුපලිතෙතා ලොකෙන බුදෙධාති මං බ්‍රාහමණ ධාරෙහී ති .."
(ද්‍රෝණ ලොක සූත්‍රය)

" බ්‍රාහමණය මහනෙල්මල, නෙළුම් මල, සුදු නෙළුම ජලයෙහි හටගෙන ජලයෙහි වැඩී ජලයෙහි නොගැවී ජලයෙන් ඈත්ව සිටී. බ්‍රාහමණය එපරිද්දෙන්ම මම ලෝකයෙහි ඉපිද ලෝකයෙහි වැඩී ලෝකයෙන් ඈත්ව වාසය කරමි. බ්‍රාහමණය ඒ නිසා මම බුදධ නමින් හඳුනාගන්න. " මේ බුදු දහමේ එන පද්මෝපමාව යි.

තථාගතයන් වහන්සේගේ පද්මාකාර ජීවිතය පිළිබඳ පෙළ දහමේ බොහෝ තැන්වල සඳහන් වෙයි. අප ජීවත්වන සමාජය පොකුණක් සේ සැලකුවහොත් එහි අෂ්ටලෝක ධර්ම නැමති හොඳ නරක චිතතාවේගයෝ ඇත. ඒවායෙහි සුභ පක්ෂයෙහි ඇලීමත් අසුභ පක්ෂය හා ගැටීමත් සාමාන්‍ය මිනිසුන්ගේ ස්වභාවය යි. තථාගතයන් වහන්සේගේ විශේෂත්වය වන්නේ එම හොඳ  නරක චිතතාවේග මැදහත්ව ඉවසාදරා සිටීම යි.

දහම් පාසැල් පොත්වල - රජයේ පාසැල් පොත්වල මේ පද්මාකාර ජීවිතය ගැන සටහන්වල එක්තරා අඩුවක් පෙනේ. ඒ හැම තැනකම කියන්නේ පොකුණ අපවිත්‍ර පරිසරයක් බවත් ඒ පරිසරයෙන් උඩට මතුවී ගතකළ ජීවිතය පද්මාකාර ජීවිතයක් බවත් ය. නමුත් මේ පොකුණේ මඩ සහිත අපවිත්‍ර දේ මෙන්ම මුතු මැණික් වැනි වටිනා දේ ද තිබිය හැක. ඒ ගැන සඳහන් නොවීම උපමාවෙහි අඩුවක් සේ පෙනේ.

අප ජීවත්වන සමාජය නැමති විලේ අලාභ, අයස, නින්දා, දුක වැනි අපවිත්‍ර දෑ මෙන්ම ලාභ, යස, ප්‍රශංසා, සැප වැනි පවිත්‍ර දේ ද දැකිය හැක. තථාගතයන් වහන්සේ නැමති පියුම හටගත්තේ ද එවැනි සමාජ පසුබිමක

ය. එහිදී බුදුන්වහන්සේ අටලෝ දහමෙහි සුභ පක්ෂයෙහි ඇලීමක් හෝ අසුභ පක්ෂය සමග ගැටීමක් ඇතිකර නොගත් හ. කෙලෙස් සහිත සාමාන්‍ය මිනිසුන්ගේ සවභාවය අටලෝ දහමේ සුභ පක්ෂයෙහි ඇලීමත් අසුභ පක්ෂය සමග ගැටීමත් ය. එම දවන්ධචාරී හැසිරීම තුළින් පුද්ගල පියුම සමාජය නැමති විලේ විකසිත නොවෙයි.

සිද්ධාර්ථ බෝධිසත්ව අවධියේ ම මේ පද්මාකාර ජීවිතය ප්‍රදර්ශනය වූ බව දැකගත හැක. බෝසතාණන් වහන්සේගේ වංසය ශාක්‍ය වංශය යි. එහි තිබුනේ ඝණතන්ත්‍ර පාලනයකි. ශාක්‍ය කුමාරවරු තම ශාක්‍ය ඝනයට ඇතුළත් කර ගන්නේ ඝනයට අදාළ කොන්දේසි පිළිගන්නවා නම් පමණී.

සිදුහත් කුමරුට අවු. 20 වූ විට ශාක්‍යයින් කුමාරයා ඝනයට ඇතුළත් කර ගත් බව ආචාර්ය බී.ආර්. අම්බෙඩ්කාර් මහතා විසින් ලියන ලද බුද්ධ චරිතයෙහි සඳහන් වේ. එතුමා සඳහන් කරන පරිදි දිගුකලක් තිස්සේ ශාක්‍යයන් හා කෝලියයන් අතර රෝහිණී ගඟේ ජලය සම්බන්ධයෙන් කලහයක් හට ගෙන තිබුණී. එම තත්වය දරුණු අතට හැරී යුද්ධයක තත්වයට පත්විය. එහිදී ශාක්‍ය ඝනය කියා සිටියේ කෝලියයන් සමග යුධ වැදිය යුතු බව යි. මෙහිදී සිදුහත් කුමාරයා ඊට විරුද්ධ විය. ශාක්‍ය ඝනයේ අදහසට විරුද්ධ වූ නිසා සිදුහත් කුමරු ඝනයෙන් ඉවත් කිරීමට තීරණය කළ බව කිය යි. එහිදී සිදුහත් කුමරු එම අදහසට කැමැති වූ බව කිය යි. සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්මී ගියේ හොර රහසේ නොවේ. අරියපරියේසන සූත්‍රය සඳහන් කරන්නේ දෙමාපියන් අකමැත්තෙන් හ!ඬද්දී ගිහි ගෙයින් පිටවී ගිය බවයි. තමාට නොගැළපෙන යමක් වේ නම් එතන කොතරම් රජ සැපතක් තිබුනත් එය අතහැර දැමීම අප මුලින් කී පද්මාකාර ජීවිතයේ ලක්ෂණය කි.

ඉතිපිසො භගවා අරහං යනුවෙන් සඳහන් වන පරිදි ගුණ නමයක් පිළිබඳව හැම දෙනාගේම මුවග රැඳුනේ එම යශෝරාවය යි. බ්‍රාහ්මණ ආදී අන්‍ය ආගමිකයින් ද තථාගතයන් වහන්සේ පිළිබඳව එබඳු යසසක් හඳුනාගෙන තිබූ බව සූත්‍ර ධර්මවල සඳහන් වේ. නමුත් එම යසස හමුවෙහි තථාගතයන් වහන්සේ ඇලී ගැලී ක්‍රියා නොකළ සේක. තථාගතයන් වහන්සේ පිළිබඳව අයසක් ද භාරතීය සමාජය තුළ පැවතිණී. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පුතුන් ඇති අයට පුතුන් නැති කරනා

අයෙකි. වැන්දඹුවන් ඇති කරනා අයෙකි. කුලයන් නසනා අයෙකි. කුලදරුවන් පැවිදි කරවීමේදී ඇතිවූ තත්‍වයකි. නමුත් ඒ අයසේ දී බුදුන්වහන්සේ කළකිරුනේ නැත. මෙසේ යස අයස හමුවෙහි ගතකළ මධ්‍යස්ථ ජීවිතයෙන් ප්‍රදර්ශනය වන්නේ පද්මාකාර ජීවිතය යි.

බුදුන්වහන්සේ ට භාරතීය සමාජයෙන් නින්දා ලැබුනු වාර අනන්ත ය. බුදුන්වහන්සේ ගෙන ගිය සාධාරණ විමුක්තිකාමී වැඩ පිළිවෙලට අකමැති පිරිසක් එදා සිටි බව පෙනේ. ඒ අය බුද්ධ චරිතය හෙලා දැකීමට විවිධ උපක්‍රම කළහ. සුන්දරී නම් රූමත් පරිබ්‍රාජිකාව මරා දමා ජේතවනාරාමයේ මල් ගොඩේ සඟවා තබා නැවත හෙලිකළේ ඒ සඳහා යි. ඒ අවස්ථාවේදී බොහෝ දෙනා බුදුන්වහන්සේට නින්දා කළ හ. ඒ නින්දා පිළිබඳ කලකිරීම බුද්ධ චරිතයෙහි ලක්‍ෂණය නොවේ. එහිදී මැදහත් සිතින් ක්‍රියා කළ සේක. බුදුන් වහන්සේට ප්‍රශංසා ලැබුණු වාර ද අනන්ත ය. විවිධ තාඩන පීඩන මැද ජීවත් වූ අය බුදුන්වහන්සේගේ මග පෙන්වීමෙන් විමුක්තිය ලබාගෙන තථාගතයන් වහන්සේට තුති පැසසුම් කළ අවස්ථා පෙළ දහමේ දැකිය හැක. ඒ කිසිදු අවස්ථාවක ඒ කීර්ති ප්‍රශංසාවල ඇලී ගැලී ක්‍රියා නොකළ සේක. ඒ බුදු සිරිතෙහි පෙනෙන පද්මාකාරී ස්වභාවය යි.

තථාගතයන් වහන්සේගේ ජීවිතයට මානසික දුක් නැති උවද කායික දුක්වලට මුහුණ පෑමට සිදුවිය. මානසික දුක් නොවුයේ මමත්‍වය නැති කළ බැවිනි. බුදුන්වහන්සේට නිතර පැවති කොන්දේ අමාරුවක් ගැන පෙළ පොතේ සඳහන් වේ. විවිධ අවස්ථාවල රෝගී තත්වයට පත් වූ සේක. ජීවිතය අවසාන සමයෙහි ලෝහිත පකඛන්දිකා නම් බලවත් රෝගී තත්‍වයට පත් වූ සේක. නමුත් ඒ කිසිදු අවස්ථාවක එම කායික දුක් හමුවෙහි කලකිරීමට පත් නොවීම බුදු සිරිතේ ස්වභාවය යි. තථාගතයන් වහන්සේ ගිහි කළ අපමණ සැප සම්පත් අනුභව කළහ. බුද්ධත්වයට පත් වීම යනු උතුම් නිවන් සැපතින් සැනසීම යි. ඒ කිසිදු අවස්ථාවක ඒ සැපතින් උද්දාමයට පත් නොවූ සේක. එයින් ද පැහැදිලි වන්නේ බුදුන්වහන්සේගේ ජීවිතය තුළ පවත්නා පද්මාකාර ජීවිතය යි.

අප නිතර දෙවේලේ භාවිතා කරන මංගල සූත්‍රයේදී සඳහන් කරන්නේ දෙලොව සරු කර ගැනීමේ මග යි. එම සූත්‍රයේද මෙම

පද්මාකාර ජීවිතය ගැන සඳහන් වේ. යම් පුද්ගලයෙකුගේ මනසෙහි අටලෝ දහම නැමති චිත්තාවේග ස්පර්ශ වු කල්හි ඔහුගේ සිත කම්පාවට පත්නොවේ නම් එය නිවනට මග බව දක්වයි. ශෝක නැති කෙලෙස් දූවිලි නැති, හැම පැත්තෙන්ම නිර්භය වු එම තත්වයට පත්විය හැක්කේ මෙම පද්මාකාර ජීවිතය තුළිනි.‸අසොකං විරජං ඛෙමං❑❑ යන වචන වලින් පැහැදිලි කරන්නේ එම පද්මාකාර ජීවිතය යි.

අප මෙතෙක් සඳහන් කළ කරුණුවලින් පැහැදිලි විය යුත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේ නැමති පියුම භාරතීය සමාජය නැමති විලේ විකසිත වු ආකාරය ගැන යි. ඒ ප්‍රබුද්ධ පද්මය සරණ ගිය ගිහි පැවිදි අප හැම දෙනාමත් ඒ පද්මාකාර ජීවිතයට අනුරූපව සකස් වන්නට අධිෂ්ඨාන කරගත යුතුයි. කෙළෙස් සහිතව ජීවත්වන වත්මන් සමාජයේ අයට සියයට සීයක්ම පද්මාකාර ජීවිතයක් ගත කළ නොහැකි බව අපි දනිමු. නමුත් සියයට පණහක් හෝ ඒ තත්වයට පත්විය හැකි නම් එය ඉතාමත් වටිනා බව සිහිපත් කරමි.

දහම් පාසැල් පෙළ පොතේ 10 ශ්‍රේණියේ 5 වන පාඩමේද රජයේ පාසලේ 10 සහ 11 යන ශ්‍රේණිවල පෙළ පොතේ ද මේ පද්මාකාර ජීවිතය පිළිබඳව සටහන් එයි. මේ දහම් පත්‍රිකාව කියවන සියළු දරුවනි, ඒ පාඩම් නැවත කියවන්න. එම පාඩම්වලින් කියා දෙන්නේ බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය ගැන ඔබ දැනුවත් කරලීමට යි. එම දැනුම ඔබට ඇති උනොත් බුදුරජාණන් වහන්සේ පිළිබඳ සතුටක් සහ විශ්වාසයක් ඇතිවේ. එවිට ඔබ ඔබේ ජීවිතය පද්මාකාර ජීවිතයකට හුරුකර ගැනීමට අදහස් කරාවී. එම පාඩම්වලින් බලාපොරොත්තු වන්නේ ඔබලාගේ ජීවිත එසේ වෙනස් කිරීමට යි. පාසලේ දී හෝ ගෙදර දී

ඔබට නොගැළපෙන දෙයක් යමෙකු යෝජනා කළොත් ඔබලාට බුදුන්වහන්සේ සිහිපත් වේවි. එවිට ඔබලා ඒ වරදින් මිදෙනු ඇත. එසේ කළොත් පුද්ගල පියුම සමාජය නැමති විලේ විකසිත වනු දැකිය හැක. එවිට විල නිසා මලත් මල නිසා විලත් බබළනු ඇත. සුවඳ හමන මල් වැනි දරුවෙනි, අපි හැමෝම මේ පද්මාකාර ජීවිතයට හුරුවෙමු.

ගෘහ පරිසරය තුළ ජීවත්වන අපේ වැඩිහිටි බෞද්ධයින් ද මේ වැදගත් පණිවිඩය තම ජීවිතයට හුරුකර ගත යුතු යි. කාමභෝගී ජීවිත ගත කරන සුදුරෙදි අඳින ගිහියන්ගෙන් සියයට සීයක්ම පද්මාකාර ජීවිතයක් අපේක්ෂා කළ නොහැකි බව අපි දනිමු. නමුත් සියයට පනහක්වත් අපේ ජීවිත තුළින් ඒ ලක්ෂණ ප්‍රදර්ශනය විය යුතුයි. බෞද්ධයින් හැටියට අපි බුදුන්වහන්සේගේ පද්මාකාර ජීවිතය හඳුනාගෙන සිටිමු. නමුත් බොහෝ දෙනා ඊට අනුගත වීමට අකමැති ය. උදාහරණයක් හැටියට ගත හොත් අද සමාජයේ සිටිනා බොහෝ දෙනා ණය කාරයෝය. ණය බරින් මිරිකී දිවා රෑ දෙකෙහි අසහනයෙන් ජීවත් වෙති. බුදුන්වහන්සේ හඳුනාගෙන සිටීනම් කිසිවෙකු ණය ගන්නේ නැත. මින් අදහස් කරන්නේ බැංකුවලින් හෝ වෙනත් ආයතනයකින් ගන්නා මුදල් ණය පමණක් නොවේ. යමෙකු පවට බය හා ලජ්ජාව නැත්නම් ඔහු කායික, වාචසික හා මානසිකව කරන වැරදි වැඩ ද බුදු දහම හඳුන්වන්නේ ණය ගැනීමක් හැටියට යි. එසේ නම් සමාජය නැමති විලේ තිබෙන අප ද්‍රව්‍යයක් ලෙස ණය හඳුනාගෙන ඉන් මිදී සිටීමට ක්‍රියා කළ යුතු යි. ණය නැමති මඩ තවරා ගන්නා බොහෝ නෙලුම් අකාලයේ විනාශ වී යන හැටි පුවත් පත් වාර්තාවලින් නිතර දැකිය හැකි ය.

සුරා පානය නොකරන සමහර ගිහියන් කියන්නේ බොන්නම වු නිසා සුරාව පානය කළ බවයි. සමහර උසස් අධ්‍යාපන ආයතනවලට නවක සිසුන් හැටියට යන දරුවන් කිසිදු කලෙක සුරාව පානය කොට නැත. නමුත් අරුම පුදුම නවක වධයේදී ඒ අපරාධයට හුරුවෙති. එහිදී ඒ සියලුම දෙනා දහම්පාසලේදී හෝ රජයේ පාසලේදී ඉගෙනගත් මේ පද්මෝපමාව සිහිකළ යුතු යි. සුරාවෙන් නැව්වත්, විශ්ව විද්‍යාල සමාජයෙන් තමා වර්ජනය කළත් මම සුරාව පානය නොකරමි❑❑ යනුවෙන් කල්පනා කළ යුතු යි. එසේ කලොත් පුද්ගල පියුම සමාජය නැමති විලේ විකසිත කළ හැකි ය.

බුදුන්වහන්සේ ගත කළ මෙම පද්මාකර ජීවිතය භික්ෂු ජීවිතයට ද ඒකාන්ත වශයෙන්ම ආදාළ ය. ගිහියාට වඩා භික්ෂුවගෙන් මේ පද්මාකාර ගති ප්‍රදර්ශනය විය යුතු ය. ධම්ම පදයේ පුෂ්ප වර්ගයේ එන 15 සහ 16 යන ගාථාවල සඳහන් වන්නේ තථාගත ශ්‍රාවකයා තුළ ප්‍රදර්ශනය විය යුතු මෙම පද්මාකාර ජීවිතය ගැන යි. මහ මග අසල දමාලූ කසල ගොඩක

පිපෙන සුවඳවත් පියුමක් මෙන් කුණු කසල බඳු අන්ධබාලයන් අතර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයා ප්‍රඥාවෙන් ඔවුන් පසුබා බබළ යි.❑❑

මෙසේ අපි කවුරුත් පද්මෝපමාව අපේ ජීවිතයට ඇතුළත් කරගෙන ජීවිතය සරුකර ගනිමු.